# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/69 - 2022 මාර්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2022.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ බලංගොඩ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමි වීම හේතුකොට ගෙන බලංගොඩ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ බලංගොඩ ප්‍රාදේශීය සභාවේ අංක 10 කිරිමැටිතැන්න කොට්ඨාසයට තේරී පත්වූ සහන් උදේශ් බෝපිටිය අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කරගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම බලංගොඩ ප්‍රාදේශීය සභාවේ අංක 10 කිරිමැටිතැන්න කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ජාවද්දනගේ ප්‍රේමදාස නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

බලංගොඩ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි සුරංග අඹගහතැන්නෙ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වන වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ජාවද්දනගේ ප්‍රේමදාස, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ අංක 10 කිරිමැටිතැන්න කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කරගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**සුරංග අඹගහතැන්නෙ,**
තේරීම්භාර නිලධාරි,
බලංගොඩ ප්‍රාදේශීය සභාව.

2022 මාර්තු මස 30 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

EOG 03 - 1086

1A - G 36527 — 20 (2022/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*